**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2022**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 17 ජූලි 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ ) ඡේදය | පනතේ විධි විධාන ප්‍රකාර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් ආයතනයේ වාර්ෂික වාර්තා හා වෙනත් මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු වුවද, 2021 වර්ෂයේ වාර්ෂික වාර්තා 2023 අප්‍රේල් 25 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2023 අප්‍රේල් 23 වන විට 2021 වාර්ෂික වාර්තා පිළියෙල කර අවසන් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයට යොමුකර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, ආදායම්, මුද්දර හා බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ ඇප තැන්පතු ඇප ආඥාපනතට අනුකූලව අයකරගෙන නොතිබුණි. | මෙම කාර්යය දැනටමත් ආරම්භ කර අංක 2023/06/01 දිනැති පාලක මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබාගෙන ඇත. අමාත්‍යාංශ අනුමැතිය ලද පසුව මෙම නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 1646 | ආයතනය විසින් පරිහරණය කරනු ලබන වාහන 25 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | දිනැති 02 ජූනි 2003 12/අංක පීර්ඩීදරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ8. 2.2 ඡේදය | දිනට 31 දෙසැම්බර් 2022 ආයෝජන කාශනවල ප්‍රමූල්‍ය ලෙස ස්ථාවර තැන්පතුවල 13,074,448.රුක්ද , භාණ්ඩාගාර බිල්පත්වල 14,337,709.රුක්ද , ,තැන්පත්කර තිබුණද කාර ඒ සඳහාදලේඛය ප්‍රවක්‍ර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අදාල ආයෝජන සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලුම් කළද පිළිතුරු ලැබී නැත. තවද, එම මුදල් පාලක මණ්ඩල අනුමැතිය සහිතව සංවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛයට අනුගත විය යුතුය. |
| (ඉ) | 2008 පෙබරවාරි 6 දිනැති අංක 05/2008 චක්‍රලේඛය | මහජන අවශ්‍යතාවය කඩිනම්වගුණාත්මකව හා , අඛණ්ඩව ඉටුකරන බවට බැඳීමක් ඇති කිරීම සඳහා ආයතනය විසින්චක්‍රලේඛය ප්‍රකාර පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | කෙටුම්පත සම්බන්ධව තවදුරටත් සාකච්ඡා කෙරෙමින් පවතින අතර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛයට අනුගත විය යුතුය. |
| (ඊ) | 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 04 හා 16 වන වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාර ආයතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධ සියළු කාරණා පිළිබඳ පාලක මණ්ඩලයට සහ අදාල අමාත්‍යවරයාට නිර්දේශ ලබාදීම සඳහා උපදේශක සභාවක් පත්කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | පනතේ විධිවාධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 6.4 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. මිලියන 24.9 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 18.5 කින් ප්‍රගතියක් නිරීක්ෂණය විය. මෙම ප්‍රගතියට රජයේ ප්‍රතිපාදන හා අර්ධ කාලීන පාඨමාලා ගාස්තු වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබා දීම සඳහා, රජයේ වියදමින් නඩත්තු කරන, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, වෘත්තීය පුහුණු අධිකාරිය මෙන්ම ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට අනුබද්ධව පවත්වාගෙන යන කිලිනොච්චියේ ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය යන වෘත්තීය පුහුණු ආයතන මගින් වර්ෂ 2 ක් හෝ ඊට අඩුකාලයක් තුල ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 4) සිසුන් වෙත ප්‍රධානය කරනු ලබයි. නමුත් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පමණක් වසර 3 ½ සිට වසර 04 ක කාලයක් ඒ සඳහා ගත කර තිබුණි. එබැවින් රජයේ වෘත්තීය පුහුණු ආයතන අතර අන්තර් සම්බන්ධතාවයක් නොතිබීම මත පුහුණුලාභීන්ගේ කාලය මෙන්ම රාජ්‍ය සම්පත්ද අපතේ ගොස් තිබුණි. | පිළිතුරු ලබා දී නැත | 2023 මැයි මස 16 වන දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය අනුව කටයුතු කල යුතුයි. |
| (ආ) 2019 දෙසැම්බර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කිලිනොච්චියේ පිහිටා ඇති ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය (SLGTI) හා යෝජිත මාතර ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය එකම පරිපාලන අධිකාරියක් යටතට ගැනීම සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පනත සංශෝධනය කිරීමට අදාලව 2020 ජනවාරි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ අනුව ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) විසින් කිලිනොච්චියේ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා ගෙන තිබුණද පනත සංශෝධනය කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | ආයතනයේ ධාරිතාව වැඩිකර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කාර්යයක් ලෙස වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ කරගෙන යාම, කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම හා වෘත්තීය සහ තාක්ෂණික පුහුණු කිරීම් පිළිබඳව සඟරා සහ වාර ප්‍රකාශන පළ කිරීම දක්වා තිබුණද, එම කර්තව්‍යයන් සමාලෝචිත වර්ෂය දක්වා ඉටුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ).සමාලෝචිත වර්ෂයේදී සේවය අත හැර ගිය සේවකයන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.211,707 ක මුදලක් අයකර ගැනීමට කටුතු කර නොතිබුණි. | නොදන්වා සේවය හැර ගිය එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.196,263 ක්වූ මුදල අය කරගැනීමට සිහිකැඳවීම් යවා ඇත.<br>අනෙක් නිලධාරීන් දෙදෙනාගෙන් අයවිය යුතු රු.8,444 ක් හා රු. 7,000 ක මුදල් අය කරගැනීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | නොගෙවූ කාර්ය මණ්ඩල ණය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) අර්ධකාලීන පාඨමාලා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ වර්ෂය පුරා රු.මිලියන 50 කට ආසන්න මුදලක් නිෂ්ක්‍රීයව පැවතිණි. | තවදුරටත් ආයතනික සංවර්ධන අවශ්‍යතා සමාලෝචනය කර අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | අර්ධකාලීනව ආයතනයට ලැබෙන මුදල් ඵලදායී කාර්යයකට යොදා ගත යුතුය. |
| (ඊ) අත්තිඩිය ශිෂ්‍ය නේවාසිකාගාරයට ගෘහ උපකරණ මිලදී ගැනීම හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය අනුමත කල රු.මිලියන 50 ක සීමාව ඉක්මවා රු. මිලියන 65 ක ප්‍රතිපාදන සලසා ප්‍රසම්පාදන දෙකක් යටතේ රු. මිලියන 64 ක්වූ බදු සහිත පිරිවැයකට රාජ්‍ය ආයතනයකින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2021 දෙසැම්බර් 24 දින භාණ්ඩ ඇණවුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 16 දින එනම් වසරක ප්‍රමාදයකින් පසු ආයතනය වෙත භාණ්ඩ ලැබී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | චක්‍රලේඛවලට අනුගත වීම හා මනා අභ්‍යන්තර පාලනයක් පැවතිය යුතුය. |
| (උ) බොරැල්ල කලාපීය මධ්‍යස්ථානයට ත්‍රීරෝද කාර්මික පාඨමාලාව සඳහා අවශ්‍ය ත්‍රීරෝද රථ මිලදී ගැනීම් 2020 පෙබරවාරි මස සිදු කර තිබුණද, මේ දක්වා අභ්‍යාසලාභීන්ගේ පුහුණු අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | සිසුන්ගේ පුහුණු අවශ්‍යතා ඉටුකිරීමට කටයුතු කල යුතුය. |
| (ඌ) ආයතනය භුක්ති විඳිනු ලබන එකතුව අක්කර 29 ක් හා හෙක්ටයාර 0.35029 ක්වූ ඉඩම් 05 ක් ලංකා ගමනාගමන මණ්ඩලය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ආයතනය විසින් මෙම ඉඩම් වල නීත්‍යානුකූල අයිතිකාරීත්වයක් හඳුනාගෙන පවරා ගැනීම් සිදුකර නොතිබුණි. | නීත්‍යානුකූල අයිතියක් නොමැති වුවද, ආයතනය එකී ඉඩම් භුක්ති විඳින බැවින් (Substance Over Form) ගිණුම්කරණ සංකල්පය අනුව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඉඩම්වල වටිනාකම ඉදිරිපත් කර ඇත. එමෙන්ම ගිණුම්කරණ සටහන් අංක 05 මඟින්ද ඉඩම් හිමිකාරීත්වය පිළිබඳ තොරතුරු හෙළිදරව් කර ඇත. | මෙම ඉඩම් වල නීත්‍යානුකූල අයිතිකාරීත්වයක් හඳුනාගෙන පවරා ගැනීම් සිදුකල යුතුය. |

(එ) වර්ෂ 05 ක් තුල ආයතනයේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ඉල්ලුම් කල ශිෂ්‍ය සංඛ්‍යාව 3,075 සිට 4,683 දක්වා වැඩි වී තිබුණද, ආයතනය සඳහා සිසුන් බඳවාගැනීම් සංඛ්‍යාව සිසුන් 600 සීමාව තුල පැවතුණි. මේ අනුව පාඨමාලාවන් සඳහා බඳවාගැනීමේ සීමාවට වඩා ඉල්ලුම් කරන සීමාව සියයට 412 සිට සියයට 681 ක වර්ධනයක් පැවතියද, ඉල්ලුමට සරිලන බඳවාගැනීම් සිදු කිරීම සඳහා ආයතනයේ ධාරිතාවය වැඩි දියුණු කර ගැනීමට අවධානය යොමුකර නොතිබුණි. ඒ සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි විය

i. ආණමඩුව හා කිලිනොච්චිය පුහුණු මධ්‍යස්ථානවල පිළිවෙළින් ඉඩම් අක්කර 09 ක් හා 25 ක් පැවතියද, මෙම මධ්‍යස්ථානවල පාඨමාලාවන් වර්ධනය කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේදී බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේ ත්‍රීරෝදරථ පාඨමාලාව සඳහා ආධුනිකයන් 37 දෙනෙකුද, ආණමඩුව කලාපීය පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා පාඨමාලාව සඳහා ආධුනිකයන් 56 දෙනෙකුද බඳවාගෙන තිබුණි, 2020 වර්ෂයේ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය සඳහා යෝජිත ඇලුමිනියම් ෆැබ්රිකේටර් පුහුණු පාඨමාලා අරම්භ කර නොතිබුණි.

iii. කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලාවන් සඳහා ආධුනිකයින් 192 ක් බඳවාගෙන ඇතත්, 2021 වර්ෂයේ පාලක මණ්ඩල අනුමැතිය ලබාදුන් කෘෂිකාර්මික උපකරණ අළුත්වැඩියා කිරීමේ පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව නව පාඨමාලා ආරම්භ කිරීමට හා ශිෂ්‍ය සහභාගීත්වය වැඩිකර ගැනීම සම්බන්ධයෙන් උපායමාර්ගික පියවර ගෙන කාර්යසාධනය වැඩිකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

iv. සිසුන් ලියාපදිංචි වූ අවස්ථාවේ සිට පුහුණු කාලය අවසන්වී රැකියාගත කිරීමට අදාල තොරතුරු පද්ධතියක් ආයතනය සතුව නොපැවතුණි.

පිළිතුරු ලබාදී නොමැත.

සිසුන් බඳවා ගැනීම, පුහුණු පාඨමාලා පැවැත්වීම හා රැකියාගත වීම පසුවිපරම් කිරීම කල යුතුය.

### 3.2 මතභේදයට තුඩුදෙනු ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරිදීමනා ගෙවීමේදී ඒ සඳහා යෝජනා සකස් කර ආයතනය විසින් සපයන ලද සේවාවලින් ලද ආදායමෙන් ගෙවීමටත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කල යුතු බවට විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ ලබාදී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | දීමනා ගෙවීමේදී චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුය. |

### 3.3 හඳුනා ගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සතු අධ්‍යක්ෂ /විදුහල්පති නිල නිවස 2020 වර්ෂයේ 2020 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොමැති වුවද, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිල නිවසේ ආරක්ෂක ගාස්තු ලෙස එකතුව රු. මිලියන 2.3 ක් වැයකර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | පවත්නා පද්ධතිය ක්‍රමවත් කල යුතුය. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ ආරම්භ කර 2020 ඔක්තෝබර් 25 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 06කින් යුත් අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. | මෙම ආයතනයේ සිසුන් සඳහා ඉදිකරන ලද නේවාසිකාගාරයේ වැඩ මේ වන විට අවසන් කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුවන අකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) 2020 වර්ෂයේ ආරම්භ කර 2021 අගෝස්තු 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 03 කින් යුත් කිලිනොච්චියේ පිහිටා ඇති ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ (SLGTI) නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. | මෙම ආයතනයේ සිසුන් සඳහා ඉදිකරන ලද නේවාසිකාගාරයේ වැඩ මේ වන විට අවසන් කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුවන අකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ විධි විධාන ප්‍රකාරව ආයතනයෙහි සේවය කරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා වැටුප් වර්ධකද, පත්වීම් ලිපිද ලබාදී නොතිබූ අතර, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් නොකල අවස්ථාවන්ද පැවතුණි. | ශ්‍රී ලංගම සේවකයින්ට 2017 අගෝස්තු මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලිපියක් ලබා දෙන ලෙස 2018 වර්ෂයේ පාලන මණ්ඩල රැස්වීමේදි අනුමැතිය ලබා දී ඇත.කෙසේ වුවද පනතෙහි ප්‍රතිපාදන අනුව ,සේවයෙන් ඉවත් වීමට අවස්ථාවක් ලබා දී ඇති බැවින් ,පත්වීම් ලිපි නිකුත් කිරීම සම්බන්ධව සේවක පාර්ශවයන්හි විරෝධයක් පැවතුණු බැවින් පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට නොහැකි විය. | කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා වැටුප් වර්ධකද, පත්වීම් ලිපිද ලබාදී දීමට කටයුතු කල යුතුය. |
| (ආ) ආයතනයේ පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට හා සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණයන් 2022 දෙසැම්බර් 31 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම තනතුරු පුරප්පාඩුව පැවතුණි. එයට අමතරව, කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 61 ක් පැවතුණි. | රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික පුහුණු ආයතන වල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින වැටුප් ගැටළු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පත් කරන ලද කමිටුව සහභාගී වී පවත්නා ගැටළු සම්බන්ධව සාකච්ඡා කර ඇත. | පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණයන් ක්‍රියාත්මක කල යුතු වීම. |
| (ඇ) ආයතනයේ අධ්‍යක්ෂ/විදුහල්පති තනතුර සඳහා 2020 පෙබරවාරි මස සිට පාලක සභා නියෝජිතයෙකු විෂය භාර ඇමතිතුමාගේ අනුමැතියකින් තොරව පත්කර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. මිලියන 2 ක දීමනාවක් ගෙවා තිබුණි. කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සිටි නිලධාරියෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ/ නියෝජ්‍ය විදුහල්පති තනතුර සඳහා 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැඩ ආවරණ | බඳවා ගැනීමට තිබූ අපහසුතා හේතුවෙන් 2020.02.18දින සිට ක්‍රියාත්මක වන පරිදි 2017අංක 15 දරන ලං.ජ.කා.අ.ආයතනීය පනතේ (1) 17 හා (5) 17 වගන්ති වලට අනුව අධ්‍යක්ෂ - විදුහල්පති ධූරයට ස්ථිර පත්වීමක් සිදු කරන තෙක් එහි කාර්යයන් ඉටු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ADM/01/10/05/15 හා 2020.02.19 දිනැති ලිපිය මඟින් අධ්‍යක්ෂ - විදුහල්පති ධූරයේ කාර්යයන් ඉටු කිරීමට පත් කර ඇත . | පනත ප්‍රකාරව බඳවාගැනීම් කල යුතුය. |

| | | |
|---|---|---|
| පදනමින් පත්කර වැටුප් හා හිග වැටුප් ලෙස රු. මිලියන 1.8 ක් ගෙවා තිබුණි. | එම ලිපියෙහි දෙවන ඡේදයට අනුව මාසිකව රු.61,000 දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත . | |
| (ඇ) කළමනාකරණ - මානව සම්පත් තනතුර දරන නිලධාරියෙකු ආයතනයේ ඇතිවූ ගැටළුකාරී තත්ත්වයක් මත පාලක මණ්ඩලයේ අනුමැතියෙන් කලාපීය මධ්‍යස්ථානයක පරිපාලන කටයුතු සඳහා යොදවා තිබුණ අතර නිලධාරියාගේ පිළිගත හැකි කාර්යසාධනයක් නොතිබුණද සමාලෝචිත වර්ෂයේ රු. 935,800ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | පාලන මණ්ඩලයේ උපදෙස් පරිදි ආයතනයේ කාර්මික සාමය පවත්වා ගැනීමට බාධාවක් වන බැවින් එම නිලධාරී මහතාව බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කර පාලන මණ්ඩලයේ උපදෙස් අනුව නැවත මෙම ආයතනය වෙත කැඳවන ලදී. | අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ස්ථාපිත කල යුතුය. |